# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1751/29 - 2012 මාර්තු 30 වැනි සිකුරාදා - 2012.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 947 දරන සුරාබදු නිවේදනය

මධ්‍යසාර සඳහා වූ සුරාබද්ද

*(රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණු කොට)*

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2012 මාර්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි—

(1) රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණුකොට තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑ ම පැළෑටියකින් ලබාගන්නා ස්වභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ පරිමාවෙන් 4% ට වඩා මධ්‍යසාර අඩංගු වන සම්මත සැර මධ්‍යසාර සෑම ලීටරයකට ම රුපියල් අටසිය තිස්අටක් (රු. 838.00) වන බද්දක් අය විය යුතු යැයි නියම කරමි. එසේ වී නමුදු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන යථෝක්ත මධ්‍යසාර කවර ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුව ද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(2) 2011 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 1728/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 939 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

04-417/1

1A - G 15859— 1135 (2012/03)

**සුරාබදු ආඥාපනත**

අංක 948 දරන සුරාබදු නිවේදනය

**ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2012 මාර්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම්කළ අරක්කු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් නවසිය අසූතුනක් (රු. 983.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුව ද, ඉහත කී නිෂ්පාදිත අරක්කු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(2) 2011 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 1728/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 940 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

04-417/2

---

**සුරාබදු ආඥාපනත**

අංක 949 දරන සුරාබදු නිවේදනය

**මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2012 මාර්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ, "විදේශීය" ස්ප්‍රීතු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් එක් දහස් එකසිය විසිතුනක් (රු. 1,123.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුවත් ඉහත කී මෙරට සෑදූ "විදේශීය" ස්ප්‍රීතු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර හෝ ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොවිය යුතු යැයි ද ;

(2) 2011 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 1728/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 941 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

04-417/3

**සුරාබදු ආඥාපනත**

අංක 950 දරන සුරාබදු නිවේදනය

**ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2012 මාර්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට (5%) වඩා අඩුවන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් අනූවක් (රු. 90.00) වන බද්දක් පැනවිය යුතු යැයි ද;

(2) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහක් (5%) සහ ඊට වැඩිවන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/ නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් එකසිය හයක් (රු. 106.00) වන බද්දක් පැනවිය යුතු යැයි ද;

(3) යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද ඒ මත්පැන් වර්ගයෙහි යම් ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද;

(4) 2011 ඔක්තෝබර් මස 19 වැනි දින අංක 1728/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 942 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2012 මාර්තු මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

04-417/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.